# Living the Lotus


*Buddhism in Everyday Life*

8
2024
VOL. 227





## Leaders in North America Study the Lotus Sutra with Dr. Dominick Scarangello, Translator of the Revised Edition of *Buddhism for Today,* Revised Edition, at the Los Angeles Dharma Center





Living the Lotus
Vol. 227 (August 2024)

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana,
Sahan Chamara, Rajitha Madurangha
published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

# ‘නිජබිම’ වෙත නැවත පිය නඟන අපි

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## නිර්මාතෘ තුමාගේ අභාවය

ඉපැරණි බෞද්ධ චින්තනය ප්‍රකාශ වන ‘සුත්ත නිපාතයේ’, ‘කෙත්වතු සීසාන භාරද්වාජ බමුණා’ යන තේමාව යටතේ වන එක් පරිච්ඡේදයක ශාක්‍යමුණි බුදුන් වහන්සේ විසින් බමුණන්ට දේශනා කල ගාථා පිළිබඳව මම ‘හදවත සහ මනස සංවර්ධනය’ යන මගේ කෘතිය ඇසුරින් හඳුන්වා දුන්නෙමි. මෙහිදීද එම ගාථාවට අනුගතව අපගේ කැපවීම සහ මානසික තත්වය පිළිබඳව කතා කල අතර, එම ගාථාව අවසානයේ දී ‘මෙසේ වඩන ලද්දහු අමරණීයත්වයේ ඵලය ලබයි’ යනුවෙන් සඳහන් කර ඇත. මේ ආකාරයට අපගේ ජීවිතය පිළිබඳව සදහන් කල පසුගිය මස කලාපයෙහි අවසාන කොටසේ දී මම ‘අමරණීයත්වය’ යන්න කුමන අර්ථයක්දැයි ඔබ සියලුම දෙනාගෙන් විමසුවෙමි. මෙහිදී, පළමුව මරණය පිළිබඳ මගේ අවංක අදහස් ප්‍රකාශ කිරීමට කැමත්තෙමි. නමුත් එයට පෙර නිර්මාතෘ තුමාගේ අභාවය සිදුවූ අවස්ථාවේ තත්වය පවසන්නම්.

1999 ඔක්තෝබර් මස 4 වන දින පෙරවරු 10:34ට මගේ ගුරුවරයා සහ අප සංවිධානයේ නිර්මාතෘ වූ, නික්යෝ නිවානෝ තුමා අභාවප්‍රාප්ත විය. සහෝදර සහෝදරියන් සහ පවුලේ සාමාජිකයන් නිර්මාතෘ තුමාගේ ඇඳ වටා වටවී, සංවිධානයේ සාමාජිකයින් දුරින් සිට බලා සිටි අතර, එය නිහඬ නික්ම යාමක් විය. මම අවසන් මොහොත දක්වාම, දෑස් වසාගෙන සිටි නිර්මාතෘ තුමාගේ පහළට යොමු වූ දකුණු අත අල්ලාගෙන සිටියෙමි. නිර්මාතෘ තුමා තම වැසී තිබුණු ඇස් විශාල ලෙස විවෘත කර ඇඳ වටා සිටි අප සියලුම දෙනා දෙස සමුගන්නා බව ප්‍රකාශ කරන ලෙස සෙමින් බලා, නැවතත් දෑස් පියාගත් අතර එසැනින් නිර්මාතෘ තුමා අවසන් හුස්ම හෙලා ඇති බව අපට අවබෝධ විය.

## ‘අමරණීයත්වය’’ යනු

නිජබිම, එයින් පැමිණියෙමි මම... නිජබිම, ඒ තමයි තැන, කවද හෝ මම ආපසු යන...’ (යොෂියෝ තෝයි). මෙය මම කාලයක පටන් කැමැත්ත දැක්වූ කවියකි. පසුගිය මස කලාපයෙන් සඳහන් කල ආකාරයට අපගේ ජීවිත ඈත අතීතයේ සිට සදාකාලික අනාගතයට ගලා යන ගංගාවක් මෙන්ය. එම ජීවිතය, ‘විශ්වයේ මහා ජීව ශක්තිය’ වන නිජබිමට නැවත යනවා ලෙසින් මරණය අපි භාරගන්නේ නම්, මරණය ගැන ඇති කනස්සල්ල පහව යනු ඇත.

තවද මා සම්බන්ධයෙන් ගත් කල, නිර්මාතෘ තුමා සාමකාමීව තම ජීවන නිජබිමට ආපසු ගමන් කල ආකාරය දැකීමෙන් පසුව ‘මටත් එලෙස මිය යාමට හැකි වුණි නම්’ යයි සිතමින් සන්සුන් මනසකින් මරණය පිළිගැනීමට මා හට හැකිවී ඇති බව හැඟේ. මා හට පරමාදර්ශී ලෙස පෙනෙන නිර්මාතෘ තුමාගේ අවසාන මොහොත, මරණයට ඇති බිය ජය ගැනීම හෙවත් ‘අමරණීය ඵලය’ අපට ලබා දුන්නේය.

‘අමරණීයත්වය’ යනුවෙන් අදහස් වන්නේ මරණයට පත් නොවීම නොවේ. සදහටම ජීවත් වීමට අවශ්‍යයි වැනි කිසිසේත්ම සැබෑ නොවන නිෂ්ඵල බලාපොරොත්තු හේතුවෙන් ඇතිවන කනස්සලු සහගත බවින් මිදී සැහැල්ලුවක් දැනීම ‘අමරණීයත්වය’ වන අතර, මම එය ‘අමරණීයත්ව ඵලය’ ලෙස සලකමි.

එසේම, අපට බුද්ධ දේශනාව ඉගෙනීමෙන් ‘අමරණීයත්ව ඵලය’ ලබා ගත හැක. අනිත්‍ය සිහි කරගෙන මරණය ජය ගැනීම එයින් එකකි. මරණයද, නිරතුරුව වෙනස් වීමේ ස්වභාවික ක්‍රියාවලියේ එක් සංසිද්ධියකි. එසේම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ‘තථාගතයන් වහන්සේගේ සදතන ජීවිතය පිළිබඳ විවරණය’ පරිච්ඡේදයේද එය දේශනා වී ඇත. අප මෙය අවබෝධ කරගෙන බුද්ධ ස්වභාවයෙන් යුතුවන අපි මරණින් මතුවද, විශ්වයේ මහා ජීව ශක්තිය සමඟ එක්ව සදාකාලිකව ජීවත් විය හැකි බව අවබෝධ වීමෙන් සිතට සැනසීමක් ගෙන දෙනවා. තවද, ධම්මපදයේ ‘උත්සාහවන්තභාවය අමරණීය තත්වයයි’ යනුවෙන් දක්වා ඇත. එදිනෙද ජීවිතය තුළ දී කුඩා දෙයක් වුවද අතපසු නොකිරීමට කරනු ලබන කැපවීම, ‘හේතුවක් ලෙස එහි ඵලයේ බලපෑමද දාමයක් සේ අසීමිතව පැතිරෙන අතර එය කිසිදු මිය නොයයි’ ලෙස හජිමෙ නකමුරා මහතා විසින් පැවසීය.

මෙයින් අදහස් වන්නේ, බෝධිසත්ව පිළිවෙත් අනුගමනය කරන අපගේ දෛනික කටයුතු කාලය සහ අවකාශය ඉක්මවා යන බලපෑමක් දිගටම එල්ල කරන බවයි. තවද, යම් පුද්ගලයෙකු මරණයට පෙර ජීවත් වූ ආකාරය සහ පෞරුෂය මිනිසුන්ගේ හදවත් තුල දිගටම පැවතීමද ‘අමරණීයත්වයේ’ එක් ආකාරයක් ලෙස සිතමි.

වර්තමානයේ මගේ වයස ශාක්‍යමුණි බුදුරදුන් පිරිනිවන් පෑ වයසට වඩා අවුරුදු 6කින් වැඩිය. නිර්මාතෘ තුමාගේ අභාවය සහ ‘අමරණීය ඵලයේ’ රසය අවබෝධ වී ඇති මට ‘කෙදිනක නිජබිමට ආපසු යාමට සිදු වුවද ගැටලුවක් නොමැත’ යනුවෙන් සිතා මානසික සැනසීමෙන් යුතුව මේ පිළිබඳව අදහස් දැක්වීමට හැකිවීම භාග්‍යයකි.

අගෝස්තු මස ‘කෝසෙයි’ සඟරාව ඇසුරිණි



# තම චරිතය තුලින් මිනිසුන්ව ධර්ම මාර්ගයට ගත හැකි පුද්ගලයෙකු වීමට

රෝ කොන්යින් මහතා, තායිනාන් ධර්ම ශාඛාව

**රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය සම්බන්ධ වීමට හේතු වූ කාරණා කුමක්ද?**

මම රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය සම්බන්ධ වීමට හේතු වූ කාරණාව ගැන කතාකරන විට, මගේ නැන්දම්මා සහ බිරිඳ (තායිනාන් ධර්ම ශාඛාවේ කියෝකයිචෝ ෆු රෙයිෂින්) රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකයින් වූ නමුත්, මම මුල් කාලයේදී වාහනයෙන් නැන්දනියව ධර්ම ශාඛාවට ගිහින් ඇරලවීම සහ නැවත ගෙන ඒමට කටයුතු කලත් ධර්මය කෙරෙහි වැඩි ඇල්මක් තිබුණේ නැ. කෙසේ වෙතත් නැන්දනිය සහ බිරිඳ සීත කාලයේ සිදු කරන විශේෂ සූත්‍ර සජ්ජායනයන් හා ධර්ම ශාඛාවේ කටයුතු සඳහා වන කැපවීම නෙත ගැටීමත් සමග ක්‍රමයෙන් මම කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වුනා.

**කුමක් හෝ විශේෂ සිදු වීමක් හැරවුම් ලක්ෂයක් තිබෙනවාද?**

මම මුල සිටම බුදු දහම විශ්වාස කල අතර, තායිවානය තුල ප්‍රචලිතව පවතින අමිතාභ සූත්‍රය සජ්ජායනය කරමින් කටයුතු කලා. කෙසේ වෙතත් 2015 අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ දිනක් බිරිඳ සමග ජපානයේ ප්‍රධාන බුද්ධ මන්දිරයේ (දයිසෙයිදෝවේ) සූත්‍ර සජ්ජායනයකට සහභාගී වීමෙන් අනතුරුව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සජ්ජායනය කිරීමට පටන් ගත්තා. පසුව උදේ හවස සූත්‍ර සජ්ජායනයට අමතරව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන අධ්‍යනය කිරීමට ආසාවක් ඇති වුනා. එම ආසාවට ස්තූති වන්නට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ගැඹුරු බව සහ එහි වටිනාකම ගැන අවබෝධ කරගැනීමට හැකි වූ අතර, එහි වූ ඉගැන්වීම් තුලින් මගේ පෞරුෂය වැඩිදියුණු කරගැනීමට හැකි වීම ගැන මම කෘතඥ වනවා. ඒ වගේම මම කවුරුද යන්න ගැන අවබෝධ කරගැනීමට හැකිවීම, නිවසට බුදුන් වහන්සේ වැඩම කරවීමට අවස්ථාව ලැබීම මගේ හැරවුම් ලක්ෂය යැයි මම සිතනවා.

**තම හදවත නිවැරදිව පවත්වා ගැනීමට, අනුගමනය කරන ඉගැන්වීම් තිබෙනවාද?**

සද්ධරම පුණ්ඩරීක සූත්‍රයේ, පොළවෙන් මතුවී ඒම යන 11 වන පරිච්ඡේදයේ සඳහන් විශිෂ්ඨ චර්යා ඇති, අප්‍රමාණ චර්යා ඇති, පිරිසිදු චර්යා ඇති සහ ඍජු චර්යා ඇති බෝධිසත්වවරුන් හතර දෙනාගේ බෝධිසත්ව චර්යාවන් මගේ අධ්‍යාත්මික දියුණුව සඳහා පුහුණු කරමින් කටයුතු කරනවා. ඇයි කියනවානම්, එම බෝධිසත්වයින් පසුකාලීනව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ලෝකය තුල ප්‍රචලිත කිරීමට, සියලු සත්වයින් දුකින් මුදවා ගැනීම, සියලුම ලෞකික ආශාවන් බිඳ දැමීම, බුදුන් වහන්සේගේ සියලු ධර්ම කරුණු ඉගෙන ගැනීම සහ සසර පුරාවට බුද්ධ මාර්ගයේ ගමන් කිරීම යන අධිෂ්ඨාන පෙරදැඩි කරගෙන කටයුතු කරන නිසා හෝසා වටයන් තුලදී



2015 අවුරුද්දේ, බිරිඳ වන ෆු රෙයිෂින් කියෝකයිචෝ සමග බුදු පිළිම ප්‍රදානෝත්සවයට සහභාගී වූ අවස්ථාවේ

පුහුණු කලයුතු කරුණු හතරක් යැයි මම සිතනවා. අපි, නිහතමානීව, ඉවසීමෙන් සහ මෛත්‍රියෙන් යුක්තව, සියලු සත්වයින් තුල 'අනුත්තර සම්මා සම්බුද්ධ හදවතක් ඇතිකිරීම' වැදගත් බව ඉගෙන ගත්තා.

තවද, 'තමාට ලබාගැනීමට නොහැකි වූ යමක් වේද, එය තමන්ට ප්‍රථමයෙන් අන් අයට ලබාගැනීමට කටයුතු කරන්න' යැයි දෝගෙන් සෙන් ගුරුතුමාගේ ගේ කියමනක් තිබෙනවා. ඒ අනුව තමන්ට වඩා අන් අයගේ සතුට ප්‍රාර්ථනා කරමින්, ලෞකික ආශාවන්ගෙන් මිදී, අවංක හදවතින් ධර්ම පුහුණුවේ යෙදෙමින්, තම හදවත සහ මනස සංවර්ධනය කරගැනීමට සිතනවා. එලෙස නිමක් නොමැති මෛත්‍රියෙන් කටයුතු කරන්නේනම්, බුද්ධත්වය සාක්ෂාත් කරගැනීමට හැකියි මා විශ්වාස කරනවා. එසේම, තම ආධ්‍යාත්මය දියුණු කරගැනීමට කටයුතු කරන ගමන්, අන්‍යයන් වෙනුවෙන්ද කටයුතු කිරීමේ හැඟීම ඉතා වැදගත්ව සලකනවා. ඒ ලක්ෂණය කෝසෙයි කායි සංවිධානයේ හෝසාවලද මූර්තිමත් වනවා.

### සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් ගැන ගැඹුරින් ඉගෙනගන්නවා නේද?

2018 අවුරුද්දේ ජූනි මාසයේ ධර්මාචාර්ය ලබා ගැනීමෙන් පසුව මම වෙනදටත් වඩා කැපවීමෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන අධ්‍යනය කිරීමට උනන්දු වුනා. නිචිකෝ නිවානෝ තුමගේ මාසික ධර්ම පණිවිඩයන් තුලින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන ගැඹුරින් තේරුම් ගැනීමට හැකිවීම සහ එම ධර්ම පණිවිඩයන් තේරුම් ගැනීමට පහසු ලෙස අත්දැකීම් කතා සහ උපමා කතා තුලින්, කියෝකයිචෝ සාන් පහදා දීමත් ගැන මම හදවතින්ම ස්තුතිවන්ත වනවා. තවද, එදිනෙදා ජීවිතය තුලදී ඉගෙන ගෙන එවා පුහුණු කරමින්, පුහුණුවන් තුලින් නැවත දේවල් අවබෝධ කරගැනීම යන 'අධ්‍යයන ආකාරදෙක' සමබරව පවත්වා ගැනීමේ වැදගත්කම ඉගෙන ගත්තා.

තවද, කෝසෙයි කායි ඉගැන්වීම් තුලින්, ජීවිතයේ එන ප්‍රශ්න ගැටළු විසදා ගැනීමට පමණක් නොව, ප්‍රශ්න තුලින් ප්‍ර ඥාව වඩවාගන්නා ආකාරයද ඉගෙනගත්තා. මීට අමතරව තවත් කෙනෙකුට ධර්මය කියාදෙන විට, විෂය කරුණු හෝ තම අදහස්ම පමණක් ප්‍රකාශ කරනවාට වඩා, වැදගත්ම කාරණය වන්නේ තමා ඉදිරියේ සිටින පුද්ගලයාගෙන් තමන් ඉගෙනගෙන අන් අය තුලින් තම හදවත වර්ධනය කර ගැනිම බව ඉගෙන ගත්තා.




2018 අවුරුද්දේ ධර්මාචර්ය ලබාගත් අවස්ථාවේදී රෝ සාන්

### තෙදොරි සහ මිචිබිකි තුලින් ලබාගත් අත්දැකීම් මොනවාද?

මම මේ වන විට 15 දෙනෙකු පමණ මිචිබිකි කර තිබෙනවා. ඔවුන් අතරින් එක් අයෙක් මා හොදින් දන්නා කියන මගේ මිතුරකු වන A සාන්, බුදු දහම අදහමින් සිටියා වුවත්, බුදු දහමේ අන්තර්ගතය ගැන එතරම් දැන සිටියේ නෑ. එනිසා මම ඔහුට කෝසෙයි කායි හි ඉගැන්වීම් කියාදීමත් සමග, බුදු දහම යනු පිරිත් සජ්ජායනය සහ ධර්මය ඉගෙන ගැනීමම පමණක් නොව, එදිනෙදා ජීවිතයට ධර්මය බද්ධ කරගෙන පුරුදු පුහුණු කිරීම බව වටහා දෙන්න හැකි වුනා. සාමාජිකත්වය ලබාගැනීමෙන් පසුව A සාන්ගේ ජීවිතයේ වෙනස්කම් රැසක් සිදු වුනා. උදහරණයක් ලෙස තමන්ගැන පමණක් වැඩිපුරම සිතමින් කටයුතු කල A සාන් මෑතක සිට, රැකියාව සමග කාර්යබහුල වුවත් අන් අයට උදවු කිරීමට කාලය වෙන්කරගන්න පටන් අරන්, අන් අයට සේවය කිරීම තුලින් තම හදවත සංවර්ධනය කරගන්න වෙහෙසෙනවා.

එලෙස කටයුතු කරමින් සිටි A සාන් දිනක් මට වූ පොරොන්දුවක් ඉටු නොකල නිසා මම ඒ ගැන ඔහුට පැවසීමෙන් A සාන්ගේ හිත රිදවූවා. A සාන් සමග එම සිදුවීමෙන් පසු, මෙලොව සියල්ල එකිනෙකට සම්බන්ධව පවතී සහ සියල්ල වෙනස්වේ (අනිත්‍ය හා අනාත්ම) යැයි කිය උගන්වන ලෝක සත්‍ය ගැන අවබෝධ කර ගැනීමටත්, තම අඩුපාඩු ගැන පසු විපරම් කිරීමට සහ මෘදු සාමකාමී හදවතක් තිබීමේ වැදගත්කම අවබෝධ කර ගත්තා.



තායිනාන් ධර්ම ශාඛාවේ සූත්‍ර සජ්ජයනයේ කනේ වදනය කරන රෝ සාන්

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ආකර්ෂණීයත්වය ගැන ඔබ සිතන්නේ කුමක්ද?**

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය තුල ඇත්තෙන්ම, හෝසා වටය යනු ජීවයයි ලෙස උගන්වනවා මෙන්, මමත් හෝසා වටය වඩාත් ආකර්ෂණීයම දෙය යැයි සිතනවා. හෝසා වටයක් තුලදී තම දුක් වේදනාවන් ඒ ආකාරයෙන්ම පවසන අතර, හෝසා නායක තුමන් එම කරුණු තෙරුම් ගෙන සද්ධර්මයට අනුව අප යායුතු මාර්ගය පෙන්වා දෙනවා. ඒ වගේම හෝසාවට සහභාගී වන අනෙක් සාමජිකයින්ද එකට එක්ව දුක සතුට දෙකම බෙදාගෙන කටයුතු කිරීම වැදගත් වේ.

තවද ඇත්තෙන්ම, අප අසලින්ම රැදෙන පුද්ගලයින්ට කෘතවේදීත්වය ප්‍රකාශකිරීමට අපහසු වුවද, අපට සමීපතම අයට, පවුලේ අයට කෘතවේදී වීමට කෝසෙයි කායි සංවිධානය තුලින් උගන්වයි. පවුල තුල එකිනෙකාට ගෞරව කරමින් කෘතවේදී වෙමින් කටයුතු කරනවානම්, සාමකාමී පවුල් ජීවිතයක් ගතකල හැකි බව මම විශ්වාස කරනවා.

**අවසන් වශයෙන් මේ මොහොතේ බලාපොරොත්තුව සහ අනාගත අධිෂ්ඨානයන් ගැන කියන්න පුළුවන්ද?**

මගේ ලොකුම ප්‍රාර්ථනයනම්, කියෝකයිචෝ ලෙස කටයුතු කරන මගේ බිරිදගේ රාජකාරීන් හොඳින් ඉටු කිරීමට හැකි වන ලෙස පිටුපසින් සිට මට හැකි අයුරින් සහය වීමයි. මේ වනවිට මම, දිනපතා උදෑසන 5 ට අවදිවන අතර සූත්‍ර සජ්ජායනය තුලින් බුදුන් වහන්සේ සමග සංවාදයක් පවත්වනවා. දිනපතා සූත්‍ර සජ්ජායනයන් තුලින් ලැබෙන කුසලානිසංස වල ආශිර්වාදයන්, අපගේ ආදි මුතුන් මිත්තන්ට වගේම යුධ ගැටුම් සහ ස්වභාවික විපත් වැනි ව්‍යසන නිසා කරදරයට විපතට පත් වූවන්ට අනුමෝදන් වේවා කියා ප්‍රාර්ථනා කරන අතර, මෙ කුසලයන් ලෝක සාමයටත් හේතු වේවායි ප්‍රාර්ථනා කරනවා. එසේම, එක් පුද්ගලයෙක් 100% ක්ම වැඩ කරනවා වෙනුවට, උදහරණයක් ලෙස, එක් එක් පුද්ගලයා එක් බලයක් බැගින් නිපදවනවානම් සියදෙනෙක් සිටියහොත් අවසානයේ බලයන් 100 ක් නිපදවේ. එය ක්‍රමයෙන් විශාල ශක්තියක් බවට පත්වී, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල දේශනා කර තිබෙන 'එකම බුද්ධ දේශයක්' යන්න මේ ලෝකය තුල යාථාර්ථයක් වේ යැයි මම සිතනවා.

මේ සදහා තායිනාන් ධර්ම ශාඛාවේ සමාජිකයින් ගෙන්, විශිෂ්ඨ වූ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙන ගෙන, නිවස තුල, රැකියා ස්ථානය තුල සහ අවට ප්‍රදේශයේ ජනතාව තුල ධර්මය ප්‍රයෝගිකව පුහුණු කිරීම තුලින්, මඩ වගුරක පිපෙන පිවිතුරු නෙළුම් මලක් මෙන් එක් එක්කෙනාගේ හදවත් තුලත් පිවිතුරු ලස්සන නෙළුම් මලක් පිපෙවා, එතුලින් ජීවිතය ආලෝකමත් වේවායි ප්‍රාර්ථනා කරනවා. මමද නොකඩවා ධර්ම පුහුණුවේ යෙදෙමින්, මාගේ ක්‍රියාවන් දැක 'එයට හේතුව කුමක්දැයි' අවට පිරිස් විමසුවහොත් 'මම රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ සාමාජිකයෙක්' යනුවෙන් පිළිතුරු දිය හැකි ලෙසට වීර්යයෙන් කටයුතු කිරිමට අධිෂ්ඨාන කරනවා. මගේ අරමුණ විශාල වන්න පුලුවන් නමුත්, තම චරිතය තුලින් මිනිසුන්ව ධර්ම මාර්ගයට ගත හැකි පුද්ගලයෙකු වීම මගේ අනාගත අරමුණයි.




2023 අවුරුද්දේ 7 වන මස 1 වෙනිදා, දුවගේ විවාහ මංගල උත්සවයේදී පවුලේ අය සමග

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## සාමාජිකයෙකු බවට පත්වූ විට


### රාජකාරී පුහුණුව (දවසේ රාජකාරීන්) තුලින් තමාව ඔපමට්ටම් කර ගැනීම

ප්‍රධාන බුද්ධ මන්දිරයේ හෝ ප්‍රදේශයන්හි ධර්ම ශාඛාවන් තුළදී පිවිසුම අසල සිට පැමිණෙන අයට දෑත් එක් කොට ආචාර කිරීම සහ පිරිසිදු කරන කටයුතු සිදු කිරීම 'රාජකාරී පුහුණුව (දවසේ රාජ්කාරීන්)' ලෙස හඳුන්වනවා.

හැම කෙනෙකුම, කවුරුත් කියන නිසා කරනවා නොව, තමන් විසින්ම සිතා තමන්ව ඔපමට්ටම් කරගැනීම පිණිස සිදුකරන ප්‍රයෝගික පුහුණුවයි. පිවිසුම අසල සිට දෑත් එක් කොට අමුත්තන් හට ආචාර කිරීම යනු අන් අයට නමස්කාර කරනවා යන්නයි. පිරිසිදු කිරීම තම හදවතේ බැඳෙන කුණු දූහුවිලි පිසදැමීමේ ක්‍රියාවලියයි.

කුමන ආකාරයේ ප්‍රයෝගික පුහුණුවක් වුවත්, 'ඔහේ කරන්නම් වාලේ කරනවා' වෙනුවට 'බුදුන් වහන්සේගේ ආශිර්වාදයක් ලෙස කරනවා' යැයි සිතන හැඟීම වැදගත් වේ.









#### දැනුමට යමක්

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය තුල 'බුදුන් වහන්සේගේ ආශිර්වාදයක් ලෙස කරනවා' යන වචනය නිතරම භාවිතා කරනවා. මෙය තමන් පියවරක් පස්සට ගෙන ක්‍රියා කරන හැඟීම පවසන වචනයක් වුවද මේ තුල 'බුදුන් වහන්සේට මෙන්ම අන් අයට ගෞරව කරමි, නිහතමානී වෙමි' යන අර්ථය ගැබ්ව තිබේ.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

## මේ මහ පොළවට කරුණාවන්ත වූ ජීවන රටාවක්




'ගෝලීය උණුසුම' යන වචනය ඔබ අසා ඇතයි සිතනවා. මිනිසුන් ස්භාවික පරිසරය ගැන නොසලකා හැර සුවපහසු ජීවන රටාවක් ගත කරමින් සිටින නිසා, වායුගෝලයේ උෂ්ණත්වය ඉහළ යමින් පවතිනවා. අපි මේ මහ පොළවේ ආශිර්වාදය ලබන නිසා ස්වභාවික පරිසරය ගැන සිතා කටයුතු කල යුතුයි.

බුදුන් වහන්සේ, ජීවී දේ නිකරුනේ විනාශ නොකරන්න, දේවල් අපතේ නොහරින්න යැයි දේශනා කලා. භාවිතයට ගත හැකි පැන්සල් පොත්පත් ඉවත දමනවානම්, අමුද්‍රව්‍ය විනාශ කරනවා වනවා.

අපි සෑම කෙනෙකුම හොදින් කල්පනා කලයුතු ගැටලුවක් නේද.

### දැනුමට යමක්

වායුසමීකරණ උෂ්ණත්වය නියමාකාරයෙන් පාලනය කරන්න, රූපවාහිනිය නරඹන කාලය අඩු කරන්න, ශොපින් බෑගයක් වෙනුවට රෙදි බෑගයක් භාවිතා කරන්න. විදුලි උපකරණ භාවිතය සීමා කරන්න නාන වතුර සේදීමට භාවිත කරන්න ගෝලීය උණුසුම අඩුකල හැකි ක්‍රියාවන් ආරම්භ කරමු.

## බුදුන් වහන්සේ සමඟ පවතින පුළුල් බැඳීම

## විශාල බුදුවරු පිරිසකට වැඳුම් පිදුම් කල පුද්ගලයන්

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



උදහරණයක් ලෙස, බුදුන් වහන්සේ විසින් 'ප්‍රඥාවට අධිපති' සේ හැඳින්වූ ශාරිපුත්‍ර මහ රහතන් වහන්සේට විවරණ ලබාදීමේදී, 'අතීතයේදී ම විසින් ඔබ බුද්ධ මාර්ගය සොයනු පිණිස ප්‍රණිධාන ලබන්නට මෙහෙය වූයෙමි' සේ දේශනා කරමින්, සැරියුත් තෙරුණ් සමඟ අතීතයේ සිට පැවති පුළුල් බැඳීම ගැන සඳහන් කරන ලදී.

එසේම, දීර්ඝ කාලයක් සමීපයේ සිටි ආනන්ද තෙරුණ් වහන්සේට විවරණ ලබාදීමේදී, 'මමත් ආනන්දත් ගගනාභ්‍යුද්ගත බුදුන් වහන්සේ සමීපයේදී එකට බුදු බව සාක්ෂාත් කරමු යැයි ප්‍රතිඥා දුන්නා. ආනන්ද තෙරුණ් ධර්ම ශ්‍රවණය ප්‍රාර්ථනා කරගෙන සිටියත්, මම නිතරම ධර්මය පුහුණු වුනෙමි. මම කළින් ධර්මාවබෝධය ලබා ගැනීමට එය හේතු විය' සේ සඳහන් කලහ. ඒ සමඟින් ආනන්ද තෙරුන් පෙර ආත්මයේ කල ප්‍රාර්ථනාව සිහියට නැගුනි.

මේ ආකාරයට පෙර භවයේ පටන් බුදුන් වහන්සේ සමඟ පුළුල් බැඳීමක් පැවතියේ සැරියුත් හා ආනන්ද තෙරුන් පමණක් නොවේ. අපිත් ඒ හා සමානයි. අපිත් ආත්ම ගණනාවක් වෙනස් වෙමින් බුදුන් වහන්සේ හමුවෙමින් පැමිණියා.

සද්ධම පුණ්ඩරීක සූත්‍රයේ, ධර්මාචාර්යතුමෙක යන 10 වන පරිච්ඡේදයේ මෙසේ සඳහන් වේ.

'බෝසතුනි මේ වන විටත් ඒ සියළු දෙන අප්‍රමාණ බුදුවරුනට පුද පූජා සිදු කර ඇති බැව් ඔබ විසින් දත යුත්තේ ය මක් නිසාද? ඔවුන් තුළ දුක් විඳින සත්වයින් කෙරෙහි තිබෙන අප්‍රමාණ කරුණාව නිසා මෙලොව උපත ලබා ඇති බැවිනි' මෙය ඉතාමත් වැදගත්ය.

'අපි, පෙර භවයන් වලදී විශාල බුදුවරු පිරිසකට වන්දනා මාන කර, විශාල පිරිසක් දුකින් මුදවනවා ලෙස බෝධිසත්ව අධිෂ්ඨානය ඇති කරගත් පිරිසකි. එසේම, දුක් විඳින සත්වයන්ව දුකින් මුදවා ගනිමු යන කරුණාව නිසා, දුක් කම්කටොළු ගහන මෙලොවට ඉපදී පැමිණියා වේ.

නමුත් ඇත්තටම පෙර භවයේ එම කරුණු අපට අමතක වී ඇති නමුත්, හදවතේ කොතැනක හෝ එය පැලපදියම් වී තිබෙනවා.

අපිට සමීපතම උදාහරණයකින් කල්පනා කර බලනවා නම්, අපි මේ ලෝකයට ඉපදී, නොයෙකුත් අයගෙන ඉගෙන ගැනීම සිදු කලා. දෙමාපියන්ගෙන්, පාසල් වල ගුරුවරුන්ගෙන්, ජීවත් වන පළාත් වල ආච්චිලා සීයලාගෙන්. නමුත් අපිට ඒ හැම එකක්ම අමතක වී තිබුනත්, සමහර අවස්ථාවන් වලදී, 'ආ... අර තැනැත්තාගෙන මෙහෙම දෙයක් කියලා දුන්නා' සේ මතකයට නැගෙන අවස්ථාවන් තිබෙනවා.

'බුදුන් වහන්සේ සමග තිබෙන පුළුල් බැඳීමද' එසේය. නමුත් එය අපිට අමතකව තිබුනත්, යම් අවස්ථාවල බුදුන් වහන්සේ සමඟ පැවති පුළුල් බැඳීම අවබෝධ වේ.

එසේ බලන කල, දැන් අපි බුදුන් වහන්සේ හමුවී, ආධ්‍යාත්මික දියුණුව ලබාගෙන තිබෙන්නේ, පෙර භවයේදීද බුදුන් වහන්සේ සමඟ පැවති පුළුල් බැඳීම නිසාය. එසේ විශාල ආනිශංස ප්‍රමාණයක් රැස් කරගෙන සිටියි. එබැවින් එම කරුණ හදවතේ කෙළවරක තැන්පත් කර තබා ගන්න.

එවිට 'බුදුන් වහන්සේ නිතරම අපි සමිපයේ සිට, ආරක්ෂා කරනවා' යන සිතේ සැහැල්ලුව දැනේවී.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහබත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 55-57 පිටු ඇසුරිණි



# විශේෂ දවස

කෙයිචි අකගාවා මහතා
අධ්‍යක්ෂක, රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථානය

ජපානයේ නම් දැන් අධික රස්නේ කාලයයි. ඔයාලට කොහොමද?

මේ මස නිචිකෝ නිවානෝ තුමාගේ මාසික ධර්ම පණිවුඩය තුල, නිර්මාතෘ තුමාගේ අවසන් මොහොත ගැන සඳහන් වනවා. 1999 ඔක්තෝම්බර් මස 4 වෙනි දින සිදුවූ එම වෙන්වීම වසර 25ක් ගත වූවත් අදටත් එය හොඳින් මතකයේ තිබෙනවා. උදේ 10:34 සිදුවූ නිර්මාතෘ තුමාගේ අභාවය, ක්ෂණිකයෙන් සංවිධානය පුරාම පැතිරගියා. ඒ දවස් වල ලෝක සාමය සඳහා වූ ආගමික සහජීවනය ඇතිකිරීමේ (WCRP) කාර්යාලයේ සේවය කළ මගේ හිත මොහොතකට නතර වුනත්, ඒ සැනින් නිර්මාතෘ තුමා ආගමික සහජීවන කටයුතු සඳහා බාහිරව ඇසුරු කල පිරිසට එම දැනුම් දීම සිදු කිරීමට කාර්යබහුල වුනා. එදින සවසම, තම ශෝකය ප්‍රකාශ කිරීමට ක්‍යෝතෝ සිට පැමිණි තෙන්දයි නිකායේ නායක ස්වාමීන් වහන්සේව, නිර්මාතෘ තුමාගේ නිවසට රැගෙන යාමේ භාරදූර රාජකාරිය මට පැවරුනා. උන්වහන්සේව තෝකියෝ දුම්රිය ස්ථානයේ පිළිගෙන කුලී රථයක නංවාගෙන නිර්මාතෘ තුමාගේ නිවසට පැමිණෙන විට අඳුර වැටී සවස 6 ත් පසුවී තිබුනා.

නිර්මාතෘ තුමාගේ නිවස ශෝක ප්‍රකාශයට පැමිණි පිරිසගෙන පිරීගොස් තිබුනා. මුළු ශරීරයම හොඳින් පෙනෙන අයුරින් විනිවිද පෙනෙන මිනී පෙට්ටියක නිර්මාතෘ තුමාගේ දේහය තබා තිබුනා. නිතරම දැක පුරුදු කළු පාට කෝට් කට්ටලය හා ඔතස්තිය පැළඳ සිටි නිර්මාතෘ තුමා, ජීවත්ව සිටින කාලයේ මෙන් සන්සුන් සිනහමුසු මුහුණින් යුතුව, පැමිණි සිටි එකිනෙකාට දෑත් එක්කොට වන්දනා කරනවා මෙන් මට දිස්විය.


නිචිකෝ සෙන්සෙයි විසින්, 'යම් පුද්ගලයෙකු මරණයට පෙර ජීවත් වූ ආකාරය සහ පෞරුෂය මිනිසුන්ගේ හදවත් තුල දිගටම පැවතීමද 'අමරණීයත්වයේ' එක් ආකාරයක් ' ලෙස කියාදුන්නා. මමත්, නිර්මාතෘ තුමාමෙන් හමුවන සෑම පුද්ගලයෙකු සමගම සන්සුන් හදවතින් දෑත් එක්කර වන්දනා කරමින් එදිනෙදා ජීවිතය ගත කිරීමට සිතමි.



ගකුරින් පාසලේ සහතික පත් ප්‍රධානෝත්සවයේදී
2024 අප්‍රේල් මස 6 වන දින (හෝරින්කකු ශාලාව)




# A Global Buddhist Movement




Information about local Dharma centers

facebook

X

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp